# ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

## (කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය)

**ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් ස්ථිර තනතුරු සඳහා මූලික සුදුසුකම් සපුරා ඇති පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ**

## නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(මූල්‍ය) - 01

**බාහිර අයදුම්කරුවන්**

**සුදුසුකම් (පහත සඳහන් 1 හෝ 2)**

01. ගිණුම්කරණය, කළමනාකරණය, වාණිජ්‍ය යන විෂයය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

සමග

එකී විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම/ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ (ICASL)/ එක්සත් රාජධානියේ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකරණ ආයතනයේ (CIMA)/ එක්සත් රාජධානියේ සහතිකලත් ගණකාධිකාරීන්ගේ වරලත් සංගමයේ (ACCA)ආශ්‍රිත සාමාජිකයෙකු වීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක 'කළමනාකරණ' මට්ටමේ තනතුරක අවම වශයෙන් ගිණුම්කරණ හෝ විගණන විෂය ක්ෂේත්‍රයේ වසර 12 පළපුරුද්දක් ලබා තිබීම.

02. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ (ICASL) / එක්සත් රාජධානියේ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකරණ ආයතනයේ (CIMA) / එක්සත් රාජධානියේ සහතිකලත් ගණකාධිකාරීන්ගේ වරලත් සංගමයේ (ACCA) පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක 'කළමනාකරණ' මට්ටමේ තනතුරක අවම වශයෙන් ගිණුම්කරණ හෝ විගණන විෂය ක්ෂේත්‍රයේ වසර 12 ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**සුදුසුකම් (පහත සඳහන් 1 හෝ 2)**

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

02. මණ්ඩලයේ කළමනාකරණ සේවා ගණයේ (MM) පළමුවන ශ්‍රේණියේ මූල්‍ය හෝ විගණන විෂයට අදාළ තනතුරක වසර 05 සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස් සීමාව -**

අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් ක්‍රමය -**

2016.04.25 දිනැති 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව 2020 සිට තනතුරට හිමි වැටුප් ප්‍රමාණය HM **1-1 2016 - රු. 81,670-15x2270** - රු. 115,720.00 ක් වේ.

බඳවා ගැනීමේ දී වැටුප් තලය රු. 81,670.00 වේ.

**පහසුකම් හා වෙනත් දීමනා -**

**ප්‍රවාහන පහසුකම් -**

රියදුරු සහිත වෙන් කළ වාහනය සහ මාසික ඉන්ධන ලීටර් 140 කට සමාන දීමනාවක් හෝ රථ වාහන දීමනාව හා ඉන්ධන දීමනාවක් හිමි වේ.

**දුරකථන පහසුකම් -**

මාසික කාර්යාලීය දුරකථනය, ජංගම දුරකථනය හා නිවස සඳහා රු. 9,000.00 ක මුදලක් ද හිමි වේ.

රජය මගින් අනුමත වෙනත් දීමනා ද හිමි වේ.

## සමාජ ආරක්ෂණ නිලධාරී (තොරතුරු තාක්ෂණ) - 01

**බාහිර අයදුම්කරුවන්**

**සුදුසුකම් (පහත සුදුසුකම් 1 හෝ 2 හෝ 3 හෝ 4 හෝ 5)**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

හෝ

02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත් වීම.

හෝ

03. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

04. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) හයවැනි (06) මට්ටම නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලබාගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

05. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) පස්වැනි (05) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලබාගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහයක (10) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**සුදුසුකම් (පහත සඳහන් 1 හෝ 2)**

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

02. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA 2) සේවා ගණයේ II ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක වසර 05 ක සතුටුදායක සේවා කාලයක් තිබීම.

**වයස් සීමාව -**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් ක්‍රමය -**

2016.04.25 දිනැති 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව 2020 සිට ඔබේ තනතුරට හිමි වැටුප් ප්‍රමාණය JM 1-1(2016) - රු. 42,600-10X775-18X1135-70,580ක් වේ.

බඳවා ගැනීමේ දී වැටුප් තලය රු. 42,600.00 වේ.

**වෙනත් දීමනා -** රජය මගින් අනුමත දීමනා හිමි වේ.

## පරිගණක වැඩසටහන් සහකාර (දෘඩාංග) - 01

**බාහිර අයදුම්කරුවන්**

**සුදුසුකම්**

පරිගණක වැඩසටහන් සකස් කිරීම සම්බන්ධව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ)පහ (V) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

**වයස් සීමාව -**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් ක්‍රමය -**

2016.04.25 දිනැති 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව 2020 සිට තනතුරට හිමි වැටුප් ප්‍රමාණය MA2-1 2016 - රු. 30,310- 10X300 - 7X350 - 4X495 - 20X660 -50,940.00ක් වේ.

බඳවා ගැනීමේ දී වැටුප් තලය රු. 30,310.00 වේ.

**වෙනත් දීමනා -** රජය මගින් අනුමත දීමනා හිමි වේ.

## පොදු කොන්දේසි

සෑම ඉල්ලුම්කරුවෙකුම,

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුයි.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුයි.
- රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සපුරාලීමට හැකියාව තිබිය යුතුයි.
- පරිගණක භාවිතය පිළිබඳ දැනුම හා ඒ පිළිබඳ වෘත්තීය අධ්‍යාපන සුදුසුකම් ලබා තිබිය යුතුයි.

මෙම තනතුරු ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායක විය යුතුයි. වසර තුනක පරිවාස කාලයකින් පසු ස්ථිර කරනු ලැබේ. ලිඛිත තරග විභාගයක් හෝ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත තනතුර සඳහා බඳවාගනු ලැබේ.

ඔබගේ අයදුම්පත්‍රය **"සභාපති, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය, අංක 18, රාජගිරිය පාර, රාජගිරිය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ප්‍රධාන කාර්යාලයේ පාලන අංශය වෙත 2020.07.20 දිනට පෙර ගෙනවිත් භාරදීම කළ යුතුය. දැනටමත් රාජ්‍ය අංශයේ හෝ ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරන අයදුම්කරුවන් ආයතන ප්‍රධානියා මගින් අයදුම් කළ යුතුයි. අයදුම්පත එවන ලිපි කවරයේ වම් ඉහළ කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුයි. වැඩිදුර තොරතුරු www.ssb.gov.lk වෙබ් අඩවියෙන් ලබාගත හැක.

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සමන් හඳරාගම**
B.A. (Special) Sociology (Hons) (CMB), MA in Sociology (CMB), CTHE (CMB).
**සභාපති,**
**ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය,**
**"සමාජ ආරක්ෂණ පියස", අංක 18,**
**රාජගිරිය පාර,**
**රාජගිරිය.**
**2020.06.30**